7.1	DMA චක්‍රලේඛ 1-2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04 ක් වත් අදාල වර්ෂය තුළ පවත්වාගෙන තිබීම	අනුකූල වේ		
08	**වත්කම් කළමනාකරණය**			
8.1	අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව, වත්කම් මිලදී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
8.2	ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධි විධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත්කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තා කර තිබීම	අනුකූල වේ		
8.3	රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
8.4	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුල සිදුකොට තිබීම	අනුකූල වේ		
8.5	ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ. 772 අනුව සිදු කිරීම	අනුකූල වේ		
09	**වාහන කළමනාකරණය**			
9.1	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
9.2	වාහන ගර්හිත වී මාස 06 කට වඩා අඩු කාලයකදී අපහරණය කර තිබීම	අනුකූල නො වේ	54-4012 හා 54-4013 අලුත්වැඩියාව සඳහා යොමුකර ඇත. 32-1187,32-3295,KH 5690 හා KH 5694 වෙනත් ආයතන වෙත පවරා දීමට කටයුතු කරමින් පවතී.	
9.3	වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
9.4	සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ. 103, 104, 109 හා 110 ප්‍රකාරව කටයුතු කිරීම	අනුකූල වේ		
9.5	2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව වාහනවල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම	අනුකූල වේ		

9.6	කල්බදු කාල සීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත්වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම	අනුකූල වේ		
10	**බැංකු ගිණුම් කළමනාකරණය**			

10.1	නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
10.2	සමාලෝචිත වර්ෂයේදී හෝ ඊට පෙර වර්ෂ වල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රීය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම			
10.3	බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ හා ගැලපුම් කල යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල වේ		
11	**ප්‍රතිපාදන උපයෝජනය**			
11.1	සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම	අනුකූල වේ		
11.2	මු.රෙ. 94 (1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කල පසු වර්ෂ අවසානයේදී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම්වලට ඵලඹීම	අනුකූල වේ		
12	**රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්**			
12.1	සීමාවන් වලට අනුකූල වීම	අනුකූල වේ		
12.2	හිහහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදුකර තිබීම	අනුකූල වේ		
12.3	වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිහහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම	අනුකූල වේ		
13	**පොදු තැන්පත් ගිණුම**	අනුකූල වේ		
13.1	කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කර තිබීම			
13.2	පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම			
14	**අග්‍රිම ගිණුම**	අනුකූල වේ		
14.1	සමාලෝචිත වර්ෂය අවසානයේදී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම			
14.2	මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කල තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්යය අවසන් වී මාසයක් ඇතුලත නිරවුල් කර තිබීම			
14.3	මු.රෙ. 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම			

14.4	අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමග මාසිකව සැසඳුම් කිරීම			
15	**ආදායම් ගිණුම**			
15.1	අදාල රෙගුලාසි වලට අනුකූලව, රැස් කල ආදායමෙන් ආපසු ගෙවීම් සිදුකොට තිබීම	අනුකූල වේ		
15.2	රැස් කර තිබූ ආදායම්, තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම	අනුකූල වේ		
15.3	මු.රෙ. 176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
16	**මානව සම්පත් කළමනාකරණය**			
16.1	අනුමත කාර්ය මණ්ඩල සීමාව තුල කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම	අනුකූල වේ		
16.2	කාර්ය මණ්ඩලයේ සියලුම සාමාජිකයින් වෙත රාජකාරි ලැයිස්තු ලිඛිතව ලබා දී තිබීම	අනුකූල වේ		
16.3	20.09.2017 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
17	**මහජනයා වෙත තොරතුරු ලබා දීම**			
17.1	තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබාදීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
17.2	ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා / චෝදනා පල කිරීමට පහසුකම් සලසා තිබීම	අනුකූල වේ		
17.3	තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
18	**පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම**			
18.1	අංක 05/2008 හා 05/2018 (1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි / සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම	අනුකූල නො වේ		සකස් කරමින් පවතී
18.2	එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි, පුරවැසි / සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා			

	ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම			
19	**මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම**			
19.1	2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම	අනුකූල නො වේ	මෙම සැලැස්ම සකස් කිරීම අවසන් කරමින් ඇත.	
19.2	කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නො අඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුල තහවුරු කොට තිබීම	අනුකූල නො වේ	මානව සම්පත් සැලැස්මට ඇතුලත් කර ඇත.මෙම වර්ෂය තුළ නිකුත් වූ වියදම් පාලනය සම්බන්ධයෙන් වන චක්‍රලේඛ අනුව පුහුණු අවස්ථා පැවැත්වීම සඳහා තිබූ අවකාශය සීමාවීම.	
19.3	ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම	අනුකූල නො වේ	2022 වර්ෂය සඳහා මානව සම්පත් සැලැස්ම සකස්කර අවසන් කර නොතිබීම	
19.4	ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙල කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කොට තිබීම	අනුකූල වේ		
20	**විගණන ඡේද වලට ප්‍රතිචාර දැක්වීම**			
20.1	ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කල විගණන ඡේද මගින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම	අනුකූල වේ		

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. } ARI/E/LCGD/FA /02/22/05 මගේ අංකය உமது இல. Your No. }

දිනය திகதி Date } 2023 මැයි 3/දින

ගණන්දීමේ නිලධාරී
ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව

ශීර්ෂය 286 - ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 <u>තත්ත්වාගණනය කළ මතය</u>

ශීර්ෂය 286 - ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2022 දෙසැම්බර් 31 දිනට ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්ය සාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම් කරන මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 <u>තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම</u>

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරණු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම්, විගණකගේ වගකීම යන වගන්තියේ තව දුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 <u>මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ගණන්දීමේ නිලධාරීගේ වගකීම</u>

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධි විධාන වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි

ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳව නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර, එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කර ගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳව විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබා දීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතික වීමක් වන නමුත් ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදුකිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රදා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මහහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මහහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳ ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මම ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1 ආදායම්

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වල ඇතුලත් රු.113,025,610 ක් වූ සත්‍ය ආදායම තුල ගාල්ල දිස්ත්‍රික් කාර්යාලය විසින් දකුණු පළාත් සභාවට බැරකල යුතු රු.3,836,750 ක් වැරදීමකින් ඇතුලත් කර තිබීම හේතුවෙන් දෙපාර්තමේන්තුවේ සත්‍ය ආදායම රු. 3,836,750 කින් වැඩියෙන් දක්වා තිබුණි.

1.6.2 මූලධන වියදම්

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වල භෞතික වත්කම් ඉදි කිරීම හෝ මිලදී ගැනීම හා වෙනත් ආයෝජන අත්කර ගැනීම් යටතේ ඇතුළත් විය යුතු රු.643,772 ක් වූ සේවක පුහුණු වැඩසටහන් වලට අදාළ දීමනා ගිණුම් ගත කර නොතිබුණි.

1.6.3 මූල්‍ය නොවන වත්කම්

(අ) දෙපාර්තමේන්තු ප්‍රධාන කාර්යාලයෙහි මිහිකත මැදුර ගොඩනැගිල්ලේ සිවිවන මහළ ඉදි කිරීම සඳහා මෙම වාර්තාවේ දිනය වන විට වැය කර ඇති රු.24,114,494 ක් සහ ගොඩනැගිලි දෙපාර්තමේන්තුවට ගෙවිය යුතු රු.320,750 ක එකතු වටිනාකම වූ රු.24,435,244 ක් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ කෙරීගෙන යන වැඩ ලෙස ජංගම නොවන වත්කම් යටතේ ගිණුම් ගත කර නොතිබුණි.

(ආ) දෙපාර්තමේන්තු අන්තර් පළාත් කොමසාරිස් කාර්යාල වලට සහ සහකාර ඉඩම් කොමසාරිස් කාර්යාල වලට අයත් නිල නිවාස,ඉඩම් සහ ගොඩනැගිලි අවසන් වරට තක්සේරු කල වර්ෂය 2013 බැවින් එම ගොඩනැගිලි වල වර්තමාන තක්සේරු වටිනාකම මූල්‍ය ප්‍රකාශන වල ඇතුලත් කර නොතිබුණි.

1.6.4 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම.

දෙපාර්තමේන්තුව සතු නිල නිවාස සහ සංචාරක බංගලා සඳහා විධිමත් හා යාවත්කාලීන කරන ලද ලේඛනයක් 2023 මැයි වන විටද පවත්වා නොතිබුණි.

2. මූල්‍ය සමාලෝචනය

2.1 ආදායම් කළමණාකරණය

සමාලෝචිත වර්ෂය අවසානයට අන්තර් පළාත් ගොවි ජනපද වලින් අයවිය යුතු හිඟ බදු ආදායම වූ රු.98,465,851 ක් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි. හිඟ ආදායමෙන් සියයට 47 ක් හෙවත් රු.46,349,919 ක් වසර 3 කට වැඩි කාලයක සිට හිඟව පවතින අතර සමාලෝචිත වර්ෂයේදී හිඟ ආදායමෙන් අයකර තිබුණු මුදල රු.16,013,918 ක් විය.

2.2 වියදම් කළමනාකරණය

මුදල් රෙගුලාසි 50 (II) ප්‍රකාරව වාර්ෂික ඇස්තමේන්තු හැකිතාක් දුරට සම්පූර්ණවත් නිවැරදිවත් පිළියෙල කල යුතු අතර එම ඇස්තමේන්තු පදනම් කරගත් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට අනුව වියදම් දැරීම කල යුතු වුවත් එසේ නොවූ අවස්ථා නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන විගණනයේදී පුනරාවර්තන වියදම් සඳහා වෙන් කල රු.509,370,000 ක් වූ ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 8 ක ප්‍රතිශතයක් එනම් රු.41,757,636 ක්ද, ප්‍රාග්ධන වියදම් සඳහා වෙන් කළ රු.70,600,000 ක ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 69 ක් හෙවත් රු.49,014,496 ක්ද වශයෙන් ශුද්ධ ප්‍රතිපාදනය ඉතිරිව තිබුණි.

(ආ) මූලධන වැය විෂයන් 3 ක් සඳහා සලසා තිබූ එකතුව රු.81,000,000 ක ප්‍රතිපාදනයෙන් රු.48,318,397 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණු අතර එම ඉතිරිය ප්‍රතිශතයක් ලෙස සියයට 65ත් 86 ත් අතර පරාසයක විය.

2.3 නීති ,රීති හා රෙගුලාසි වලට අනුකූල නොවීම.

නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත සඳහන් පරිදි වේ.

නීති ,රීති හා රෙගුලාසි වලට යොමුව	අනුකූල නොවීම
(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය	
(i) xxiv පරිච්ඡේදය 4.2.5 ඡේදය(අ)	ආපසු ගෙවා අවසන් කර නැති ණය මුදලකින් අයකර ගැනීමට ඉතිරිව තිබෙන මුදල්ද , රජයට හෝ ලෝහෝර් ආර්යා අරමුදලට හෝ ගෙවීමට තිබෙන වෙනත් මුදල්ද විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ නිලධාරියාගේ පරිවර්තිත විශ්‍රාම වැටුපෙන් හෝ පාරිතෝෂික මුදල් වලින් හෝ අයකර ගත යුතු වුවත්, විශ්‍රාම ලබා ඇති නිලධාරියෙකුගේ වර්ෂ 5 ට වැඩි රු.19,940 ක් ද, මාස 3 – 12 දක්වා පවතින රු.264,302 ක්ද, මාස 1 -3 අතර පවතින රු.136,571 ක අය විය යුතු ශේෂයන් පවතින බව නිරීක්ෂණය විය.
(ii) xxiv පරිච්ඡේදයේ 4.5 සහ 4.6 වගන්ති	i. සේවය අතහැර ගොස් ඇති නිලධාරියෙකුගෙන් මාස 1 ත් 12 අතර අයවිය යුතු රු.199,354 ක ණය ශේෂයක් සහ මිය ගිය නිලධාරියෙකුගෙන් අය විය යුතු රු.180,722 ක් සම්බන්ධයෙන් ප්‍රධාන ණයකරුගෙන් අයකර ගත නොහැකි අවස්ථාවලදී අනුගමනය කළයුතු යැයි නියම කොට ඇති ක්‍රියාමාර්ගය ඇපකරු සම්බන්ධයෙන් අනුගමනය කොට එම මුදල් ඇපකරුගෙන් අයකර ගතයුතු අතර, ප්‍රධාන ණයකරු මියගොස් ඇත්නම් ඔහුගේ උරුමක්කාරයන්ගෙන්ද අයකර ගත නොහැකි නම් නීතිපති උපදෙස් ලබා ගත යුතු වුවද, ඒ අනුව කටයුතු කර නොතිබුණි.
	ii. වැඩ තහනම් කළ නිලධාරීන් 04 ක ගෙන් අයවිය යුතු මුලු ණය ශේෂය රු.335,051 ක් වූ අතර ඒ තුල පවතින වසර 5 ට

	වැඩි ණය ශේෂ එකතුව රු.218,251 ක් සහ වර්ෂ 1 – 2 ත් අතර ණය ශේෂය වන රු.116,800 ක් සම්බන්ධයෙන් විනය පරීක්ෂණ කටයුතු අවසන් කර විනය නියෝග ක්‍රියාත්මක කිරීමට සහ ණය මුදල් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.
(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය	
මු.රෙ. 109(1)	අයභාර, රක්ෂණ, ඇප යනාදිය වැනි සියලු මාර්ග වලින් අය කර ගත යුතු මුදල් ප්‍රමාණයන් නිර්ණය කිරීමද, ඇතුළුව සියලුම ප්‍රාරම්භක කටයුතු අවසන් කරනු ලැබීමෙන් පසු හානියෙන් අය කර ගත යුතු උපරිම වටිනාකම හා අය කර ගැනීමට තීරණය කරන මුදලක් අතර යම් වෙනසක් ඇතොත් ඒ වෙනස පොතෙන් අස්කර දැමීමට, දෙපාර්තමේන්තුවට බලය හිමි වුවද, එකතුව රු.5,283,762 ක් වූ අවස්ථා 08 ක් සම්බන්ධයෙන් එසේ කටයුතු කර නොතිබුණි.
(ඇ) මුදල්, ආර්ථික හා ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යාංශ චක්‍රලේඛ	
2019 දෙසැම්බර් 17 දිනැති 08/2019 දරන චක්‍රලේඛයේ 2.1 වගන්තිය	සියළුම රාජ්‍ය ආයතන විසින් විද්‍යුත් ප්‍රසම්පාදනය සඳහා (Eloctronic Goerment Procument (E.G.P) Secretariat)2020 ජනවාරි 31 දිනට පෙර ලියාපදිංචි විය යුතු වුවත්,මෙම දෙපාර්තමේන්තුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් අදාල ලියාපදිංචිය ලබාගෙන නොතිබුණි.
(ඇ) රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ	
2018 ජනවාරි 24 දිනැති 05/2018 (1) දරන චක්‍රලේඛයෙන් සංශෝධිත 2008 පෙබරවාරි 06 දිනැති අංක 05/2008 දරන චක්‍රලේඛය	දෙපාර්තමේන්තුව විසින් පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තිය පිළියෙල කර එය මහජනයාට විවෘත වන පරිදි ප්‍රදර්ශනය කිරීමට කටයුතු කර නොතිබුණි.

2.4 පොදු තැන්පත් පරීක්ෂාව

මු.රෙ.571 (2) හා (3) ඡේද ප්‍රකාරව ඉකුත් වූ සියලුම තැන්පතු රාජ්‍ය ආදායමට බැර කළ යුතු අතර ii වැනි හා iii වැනි පංති වල ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් වන විට ඒවා රාජ්‍ය ආදායමට බැර කිරීමෙන් පසුව ආපසු ලබා ගැනීම සඳහා කෙරෙන ඉල්ලීම් හැකිතාක් දුරට වලක්වා ගැනීමේ අදහසින් එම තැන්පතු රාජ්‍ය ආදායමට බැර කිරීමට පෙර විමසීම් කර බැලිය යුතු අතර අදාළ විස්තර ලැබෙන තෙක් තැන්පතු ගිණුමකට අවිනිශ්චිතව තබා ගෙන ඇති මුදල් ඉකුත් වූ තැන්පතු වශයෙන් සලකනු ලැබීම සඳහා ඉඩ නොතබා අවස්ථාවෝචිත පරිදි අදාළ ගිණුමට හෝ රජයේ ආදායමට හෝ බැර කළ යුතු වුවද, 2015 සිට 2020 දක්වා පොදු තැන්පත් ගිණුමෙහි රඳවාගෙන ඇති රු.51,484,589 ක් වටිනා තැන්පතු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි උපදෙස් ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කාර්යසාධනය

3.1.2 බිම්සවිය වැඩසටහන

(අ) බිම් සවිය ව්‍යාපෘතිය යටතේ දෙපාර්තමේන්තුව විසින් ඉඩම් කච්චේරි පැවැත් වීම, බලපත්‍ර නිකුත් කිරීම, දීමනා පත්‍ර නිකුත් කිරීම, ජංගම සේවා පැවැත්වීම, කොටියාශ දින පැවැත්වීම සහ ගැටළු වලට විසඳුම් සෙවීම යන ක්‍රියාකාරකම් සැලසුම් කර තිබුණු අතර ඉඩම් කච්චේරි පැවැත් වීම හැර අනෙක් කාර්යන්හි ප්‍රගතිය සියයට 3 ත් සියයට 39 ත් අතර පහළ පරාසයක පැවතුණි.

(ආ) සමාලෝචිත වර්ෂය තුල ඉඩම් කච්චේරි 30 ක් පැවැත්වීමට සැලසුම් කර ඉඩම් කච්චේරි 71 පවත්වා තිබුණි. එය වාර්ෂික ඉලක්කයට වඩා ඉහල අගයකි. ඒ අනුව පැවැත්විය හැකි ප්‍රශස්ත ඉඩම් කච්චේරි පිළිබඳව අවධානය යොමු නොකර පසුගිය කාල පරිච්ඡේදය තුල ඉතා පහළ ඉලක්කයක සිට සැලසුම් සකස් කර ඇති බව නිරීක්ෂණය විය.

3.1.3 කාර්ය සාධන ගිවිසුම් අත්සන් නොකිරීම

2018 ජනවාරි 24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 02/2018 හි ඇමුණුම 01 ආකෘතිය පදනම් කර ගනිමින් 2018 වර්ෂයේ පටන් කාර්ය සාධන ගිවිසුම් අත්සන් කිරීම සිදු කළ යුතු වුවත් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් එම කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර නොතිබුණි.

3.1.4 අපේක්ෂිත නිමැවුම් මට්ටම ලබා නොගැනීම

ජාතික ප්‍රතිපත්තියක් තුළ මනා සම්බන්ධීකරණයකින් යුතුව සංවර්ධනයේ විස්වාසදායී බව සහතික කරමින් රජයේ ඉඩම් ප්‍රශස්ත මට්ටමින් භාවිතා කිරීමට මහ පෙන්වමින් නිරවුල් ඉඩමක අයිතිය තහවුරු කෙරෙන විධිමත් කළමණාකාරීත්වයක් පවත්වාගෙන යාම දෙපාර්තමේන්තු ජාතික මෙහෙවර ඉටු කර ගැනීමේදී, සමාලෝචිත වර්ෂයේදී එහි ප්‍රගතිය පහත පරිදි විය.

I. රජයේ ඉඩම් ආඥා පනත යටතේ බදු පදනම මත ඉඩම් ලබා දීමේ අරමුණට සාපේක්ෂව බදුකර සකස් කිරීමේ ඉලක්කගත ප්‍රමාණය 1500 ක් වුවද, සත්‍ය බදු කර සකස් කිරීම 475 ක් හෙවත් සියයට 32 ක ප්‍රතිශතයක පැවතුණි.

II. දෙපාර්තමේන්තුවේ ක්‍රියාත්මක සැලැස්මට අනුව රජයේ ඉඩම් තොරතුරු කළමණාකරණ පද්ධතියට ඉඩම් කැබලි 100,000 ක් ඇතුළත් කිරීමට සැලසුම් කර එම පද්ධතියට ඇතුළත් කල කැබලි ගණන 24,500 ක් පමණ විය. එය සියයට 24 ක ප්‍රතිශතයක් ගෙන තිබුණි.

III. ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ රාජ්‍ය ඉඩම් තොරතුරු හා කළමණාකරණ පද්ධතිය ඔස්සේ බලපත්‍ර සකස් කිරීමේ ඉලක්කය 5000 ක් වුවද, සත්‍ය වශයෙන් සකස් කළ බලපත්‍ර සංඛ්‍යාව 517 ක් හෙවත් සියයට 10 ක ප්‍රතිශතයක් ගෙන තිබුණි.

IV. ඉඩම් ලේඛන ඇසුරින් තොරතුරු දත්ත පද්ධතියට ඇතුළත් කිරීම පිළිබඳ විග්‍රහාත්මකව සමාලෝචනය කිරීමේදී 2020 වර්ෂය තුළ 63,955 ක්ද, 2021 වර්ෂයේ 62,785 ක්ද, 2022 වර්ෂය තුල එය 24,499 ක් ලෙස ද සඳහන් වන අතර එය 2021 වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී 38,286 කින් අඩු වී තිබුණි.

V. එසේම අනු ලේඛන සහිතව ඉඩම් වල ක්ෂේත්‍ර තොරතුරු දත්ත පද්ධතියට ඇතුලත් කිරීමේ ප්‍රගතිය 2020 වර්ෂයේ 90,337 ක්ද, 2021 වර්ෂයේ 15,973 ක්ද, 2022 වර්ෂයේ 14,766 ක්ද විය. එහි ප්‍රගතිය 2020 වර්ෂයට සාපේක්ෂව, 2021 වර්ෂයේදී සියයට 82 කින්ද, 2022 වර්ෂයේදී සියයට 84 කින් ද අඩුවී තිබුණි

3.2 වත්කම් කළමනාකරණය

දෙපාර්තමේන්තුවේ නිල නිවාස පිළිබඳ ලිපි ගොනු පරීක්ෂා කිරීමේදී දැනට භාවිතා කරන නිල නිවාස 89 ක්ද, භාවිතයට නොගන්නා නමුත් භාවිතා කළ හැකි නිල නිවාස 59 ක්ද, භාවිතයට ගත නොහැකි නිල නිවාස හෝ දැනට ඉඩම පමණක් පවතින නිල නිවාස 61 ක්ද, වෙනත් දෙපාර්තමේන්තු වෙත පවරා ඇති නිල නිවාස 17 ක්ද, අනවසර පදිංචිකරුවන් පදිංචි වී ඇති නිල නිවාස 14 ක්ද, පැවරීම් කටයුතු සිදු කරමින් පවතින නිල නිවාස 08 ක්ද, වශයෙන් නිවාස 248 ක් පැවතුණි.එම නිවසයන් හි දක්නට තිබුණු ප්‍රධාන අඩුපාඩු හා දුර්වලතා ලෙස,

එම ජල පහසුකම් නොමැති වීම, පරිහරණ උපාංග කැඩී තිබීම, නිවාස වහල හා බිත්ති අබලන් වී දිරාපත් වී යාම, අනවසර පදිංචි වීම, අවිධිමත් ලෙස නිල නිවාස වලින් ඉවත් නොවීමත් ඒ සඳහා දණ්ඩන කුලිය අය නොකිරීම, නිල නිවාස විධිමත්ව හා ක්‍රමානුකූලව නිල නිවාස අයදුම් කරන නිලධාරීන්ට භාර නොදීම, නිල නිවාස හිමි නැති නිලධාරීන්ට නිල නිවාස ලබා දීම වැනි කරුණු නිරීක්ෂණය වූ අතර එම නිවාස සම්බන්ධයෙන්

I. 2022 අප්‍රේල් 04 දිනැති භාණ්ඩාගාර ලේකම්ගේ වත්කම් කළමණාකරණ වක්‍රලේඛ අංක 05/2022 අනුව, රජයේ දේපල අස්ථානගත වීම සහ අවභාවිතය වැළැක්වීමට මෙන් ම රජයේ දේපළ උපරිම ඵලදායිතාවයෙන් ප්‍රයෝජනයට ගැනීම තහවුරු කිරීම සඳහා රජය සතු සියළුම මූල්‍ය නොවන වත්කම් නිසි පරිදි ලේඛන ගත කර පවත්වා ගැනීම සහ වාර්තා කිරීම සියලුම ආයතන ප්‍රධානීන්ගේ අනිවාර්යය කාර්යයක් වන අතර, සියලුම රාජ්‍ය ආයතන ප්‍රධානීන් විසින් ඔවුන්ගේ අධීක්ෂණය යටතට ගැනෙන අයතනයන්හි සියලුම මූල්‍ය නොවන වත්කම්, වත්කම් කළමණාකරණ වක්‍රලේඛ විධිවිධාන අනුව යාවත්කාලීන කර නියමිත දිනට කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තා කළ යුතු වුවත් දෙපාර්තමේන්තුව සතු නිල නිවාස සහ සංචාරක බංගලා පිළිබඳ විස්තර යාවත්කාලීන කර විධිමත්ව ලේඛනගත කර නොතිබුණි.

II. රජයේ නිල නිවාස තම ආයතනය සතු වත්කම් බවත්, එම වත්කම් නිශ්කාර්යව හෝ අවභාවිතයට නෙයොදා වක්‍රලේඛ හා ආයතන සංග්‍රහයේ නීති රීති වලට අනුකූලව කාර්යක්ෂමව හා ඵලදායී ලෙස භාවිතා කිරීම ආයතනය සතු වගකීමක් වුවද, එසේ සිදු කර නොතිබුණි.

3.3 පාඩු හා හානි

වාහන අනතුරු සම්බන්ධයෙන් කටයුතු නොකල අවස්ථා පහත දැක්වේ.

(අ) අංක KK - 6496 වාහනය 2018 ජූලි 06 දින අනතුර සම්බන්ධ හානියේ වටිනාකම රු.884,621 ක් විය. මු.රෙ.104 ප්‍රකාරව පරීක්ෂණ පවත්වා මු.රෙ.103(ඊ) වාර්තාවට අනුව රියදුරු වගකිව යුතු බව සඳහන් කර ඇතත් එම මුදල් අයකර ගැනීමේ ගැටළුවක් මතු වී ඇති බැවින් නැවත මු.රෙ.104 පරීක්ෂණ කමිටුවක් පත් කර ඇතත් 2023 මැයි විගණිත දින දක්වාම අලාභය අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) අංක NA - 9290 දරන වාහනය 2018 ඔක්තෝබර් 31 දින අනතුරට පත් වී එහි හානියේ වටිනාකම රු.4,036,061 ක් වුවත් රක්ෂණ සමාගමෙන් රු.3,389,561 ක් ප්‍රතිපූර්ණය කරගෙන ඇතත් දෙපාර්තමේන්තුව විසින් දරන ලද මුදල රු.646,500 ක් වී තිබුණි.අදාල හිඟ මුදල මු.රෙ 109 ප්‍රකාරව වගකිව යුත්තන්ගෙන් අය කර ගැනීමට හෝ ගිණුම් වලින් ඉවත් කිරීමක් හෝ සිදුකර නොතිබුණි.

(ඇ) අංක PF– 6074 දරන වාහනය 2022 දෙසැම්බර් 21 දින අනතුර සම්බන්ධ හානියේ වටිනාකම රු.931,185 කි. මුදල් රෙගුලාසි 109 යටතේ අලාභය කපා හැරීමට යෝජනා වී තිබුණද, මේ පිළිබඳව ගිණුම් වල හෙලිදරව් කර නොතිබුණි.

(ඈ) අංක PD– 6509 දරන වාහනය 2021 දෙසැම්බර් 23 දින අනතුරට පත් වී එම හානියේ වටිනාකම රු.2,161,650 ක් වුවත් ඒ සඳහා 2023 මැයි වන විටද රක්ෂණ වන්දි ලබා ගැනීම හෝ මුදල් රෙගුලාසි 109 ප්‍රකාරව මේ සඳහා වගකිව යුතු අයගෙන් වන්දි ලබා ගැනීම හෝ සිදු කර නොතිබුණි.

3.4 භාණ්ඩ සමීක්ෂණය

සමාලෝචිත වර්ෂයට අදාළව වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයේදී ඌණතා හඳුනා ගෙන තිබූ අතර, එම භාණ්ඩ මිලදී ගත් වර්ෂය, ඒවායෙහි වටිනාකම්, සහ ඌණතාවයන් වලට වගකිව යුතු නිලධාරීන් හඳුනා ගෙන මුදල් රෙගුලාසි 103 හා 104 වගන්තිය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

3.5 කළමණාකරණ දුර්වලතා

(අ) භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කැණීම් කාර්යාංශයේ අධ්‍යක්ෂ ජනරාල් 2022 ජනවාරි 31 දින නිකුත් කළ අංක 212/02/2022 දරන චක්‍රලේඛය අනුව භූ සම්පත් කැනීම් සඳහා මැදිහත් වන සියළු රාජ්‍ය ආයතන සඳහා ඒකීය ගාස්තු ක්‍රමවේදයක් ක්‍රියාත්මක කිරීම සඳහා මුදල් අමාත්‍යාංශයේ අනුමැතිය ලැබී නොමැති බව සඳහන් කර තිබියදී ඉඩම් කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කල අංක L2/1/89/ චක්‍රලේඛ/2022 දරන 2022 සැප්තැම්බර් 15 දිනැති අනුරාධපුර දිස්ත්‍රික්කයේ සියලුම ප්‍රාදේශිය ලේකම්වරුන් ඇමතූ ලිපිය මඟින් කැණීම් කරනු ලබන බනිජ ප්‍රමාණයට අදාළ කැලෑ නිෂ්පාදන ගාස්තු භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කැණීම් කාර්යංශය විසින් සිදු කරන බැවින් මින් ඉදිරියට අදාළ ගාස්තු අය නොකරන ලෙස දන්වා තිබුණි. ඒ අනුව කැණීම් සඳහා ඒකීය ගාස්තු ක්‍රමවේදයක් ක්‍රියාත්මකව නොතිබියදී, දැනට අය කළ කැලෑ නිෂ්පාදන ගාස්තු අය නොකිරීමට ගනු ලැබුණු තීරණය අනුව 2022 සැප්තැම්බර් 15 දින සිට අදාළ ඒකීය ගාස්තු ක්‍රමවේදය ක්‍රියාත්මක කරන දිනය දක්වා කාලයට අදාළ කැලෑ නිෂ්පාදන ගාස්තුව රජයට අහිමි වන බව නිරීක්ෂණය විය.

(ආ) ශ්‍රී ලංකාවේ මුළු භූමි ප්‍රමාණයෙන් 20% ක් පමණ වන රජයේ ඉඩම් සම්බන්ධ සෘජු වගකීමක් දෙපාර්තමේන්තුව වෙත පැවරෙන බව හඳුනා ගෙන තිබුණද 1931 වර්ෂයේ දෙපාර්තමේන්තුව පිහිට වූ දින සිට සිදු කරන ලද ඉඩම් බැහැර කිරීම් ඇතුලත් කරමින් සකස් කරන ලද ඉඩම් ලේඛනයක් පවත්වා නොතිබුණි.

(ඇ) 2008 වර්ෂයේදී මිල දී ගත් රු.6,000,000 ක් ලෙස තක්සේරු කරන ලද වටිනාකම රු.12,000,000 ක් වූ KH - 5690 දරන වාහනය අපහරණය කල යුතු වුවත් මෙම වාර්තාවේ දින වන විට ද අපහරණය කර නොතිබුණි.

4. තිරසර සංවර්ධනය

සමාලෝචිත වර්ෂයේ කාර්ය සාධන වාර්තාව මඟින් තිරසර සංවර්ධන අරමුණු ඉලක්ක ලෙස ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ බලපත්‍ර නිකුත් කිරීම සහ දීමනා පත්‍ර සකස් කිරීම දක්වා ඇතත් දෙපාර්තමේන්තුව සහ පළාත් සභා මඟින් අපේක්ෂිත අරමුණු ඉටු කර ගැනීමේ ප්‍රගතිය වෙත් කර දක්වා නොතිබීම හේතුවෙන් තිරසර සංවර්ධන අරමුණු ඉටු කර ගැනීමට දෙපාර්තමේන්තුවේ දායකත්වය ඇගයීමට නොහැකි වී තිබුණි.

5. මානව සම්පත් කළමණාකරනය

දෙපාර්තමේන්තුවේ අනුමත හා තත්‍ය කාර්ය මණ්ඩල පිළිබඳ තොරතුරු පහත දැක් වේ.

	අනුමත සංඛ්‍යාව	තත්‍ය සංඛ්‍යාව	පුරප්පාඩු සංඛ්‍යාව
ජ්‍යෙෂ්ඨ	53	34	19
තෘතියික	38	06	32
ද්විතීයික	673	473	200
ප්‍රාථමික	140	79	61
එකතුව	904	592	312

(අ) දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු 19 ක් ද, තෘතියික කාර්ය මණ්ඩලය 32 ක්ද, ද්විතීයික කාර්ය මණ්ඩලය 200 ක් සහ ප්‍රාථමික අංශය 61 ක් ලෙස පැවති එම පුරප්පාඩු 2023 මැයි මස වන විටද සම්පූර්ණ කර ගෙන නොතිබුණි.

(ආ) පුරප්පාඩු වී ඇති තනතුරු අතුරින් සහකාර ඉඩම් කොමසාරිස්වරු 11 දෙනෙකුගේ පුරප්පාඩුද, ජනපද නිලධාරීන් 28 දෙනෙකුගේ වැඩ අධිකාරී 20 දෙනෙක්ද, ජනපද නිලධාරී 117 දෙනෙක්ද, කළමණාකරණ නිලධාරී 97 ක්ද, ලේඛන භාරකරු 12 දෙනෙකු සහ මැහුම් සහයක 18 දෙනෙකුගේ පුරප්පාඩු පවතින බව තවදුරටත් නිරීක්ෂණය විය.

(ඇ) දෙපාර්තමේන්තුව තුළ සංවර්ධන සහකාරවරු 260 දෙනෙකු අනුමත වී තිබුණු අතර, සේවයේ නියුතු සංඛ්‍යාව 303 ක් වූයෙන් සංවර්ධන සහකාරවරු 43 දෙනෙකුගේ අතිරික්තයක් පැවතුණි.

(ඈ) 2018 ජනවාරි 24 දිනැති රාජ්‍ය පරිපාලන වක්‍ර ලේඛ 02/2018 අනුව මානව සම්පත් සංවර්ධන සැලැස්මක් පිළියෙල කළ යුතු වුවත් සමාලෝචිත වර්ෂයට අදාළව මානව සම්පත් සංවර්ධන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

පී.කේ.එම්.පී. තෝනිස්
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
ජාතික විගණන කාර්යාලය

පී.කේ.එම්.පී.තෝනිස්
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
විගණකාධිපති වෙනුවට